ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 20 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග ලේඛනය අනුව රු. 1,496,974 ක් වූ අවසන් තොගය රු. 1,696,134 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී පුස්තකාල පොත් මිලදී ගැනීමට වැයකර තිබුණු රු. 11,006 ක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා පුස්තකාල පොත් එම වටිනාකමෙන් අඩුවෙන් දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ පුස්තකාල දෙකක් සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු. 87,222 ක් වූ පොත් 194 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු නිවාස ණය පොලීවල රජයේ දායකය වූ රු. 89,067 ක් වර්ෂයේ ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2. නොසැසඳුණු ගිණුම්
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය, කේවල ණය ලේඛනය අනුව රු. 5,337,814 ක් වූ අතර එය සේවක ණය පාලන ගිණුම අනුව රු. 5,273,811 ක් විය.

(ආ) විවිධ තැන්පතු ලේඛනයේ කේවල ශේෂ වල එකතුව රු. 1,377,199 ක් වූ අතර ඊට අදාල විවිධ තැන්පතු පාලන ගිණුමේ ශේෂය රු. 10,307,686 ක් වූයෙන් වෙනස රු. 8,930,487 ක් විය.

(ඇ) අත්තිකාරම් ලේඛනයේ ශේෂ එකතුව රු. 4,510,231 කට අදාලව අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය රු. 7,367,625 ක් වූයෙන් වෙනස රු. 2,857,394 ක් විය.

(ඈ) ණය හිමි පාලන ගිණුම හා සමාලෝචිත වර්ෂය අවසානයට ණය හිමි ලේඛනයේ ශේෂ එකතුව අතර රු. 11,439,691 ක් වූ වෙනස සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

1.3.3 ලැබියයුතු ගිණුම්
---------------------

පහත කරුණු නිරීක්ෂණය විය

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා හිඟ ජල ගාස්තු රු. 3,652,412 කින් රු. 3,177,100 ක් 2018 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

(ආ) වසර ගණනාවක සිට පැවත එන එකතුව රු. 370,250 ක් වූ හිඟහිටි කසල ගාස්තු 2018 අප්‍රේල් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
---------------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ස්ථාවර වත්කම් සහ ජංගම වත්කම් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛන, කාල විශ්ලේෂණ වාර්තා හා ණය ගැති ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 155,425,448 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

(ආ) ලැබියයුතු සහ ඉදිරියට ලද ගිණුම් 04 කට අදාල එකතුව රු. 4,222,295 ක් සඳහා ජර්නල් වවුචර් සහ ජර්නල් සටහන් ඉදිරිපත් නොකෙරුණි.

1.3.5 අනුකූල නොවීම්

1.3.5.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| (i) 24 වන වගන්තියේ 1 (අ) හා (ආ) උප වගන්ති | - | සභාව සතු මාර්ග ගැසට් කිරීමට හෝ ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා 2003 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි. |
| (ii) 126 (vii) (ඊ) වගන්තිය | - | සභා බල ප්‍රදේශය තුළ පවතින දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (iii) 134 වගන්තිය | - | සභාවේ දියුණු ගම් ප්‍රදේශ ලෙස 2015 වර්ෂයේ හඳුනාගෙන තිබූ ගම් ප්‍රදේශ 06 කින් වරිපනම් බදු අයකිරීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) 14(1) රීතිය | 12,379,000 | 2017 වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුලත් නොවූ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ජාතික වැඩසටහන යටතේ ඉටුකරන ලද රු. 12,379,000 ක් වූ ව්‍යාපෘති 11 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් මගින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 143 රීතිය | 10,307,686 | සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එක් එක් පන්තියේ තැන්පතු වලට අදාල ලෙජරය මාසිකව තුලනය කර එම ශේෂයේ එකතුව ප්‍රධාන ලෙජර් ගිණුමේ ශේෂය සමඟ ගැලපීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | 165 රීතිය | - | ප්‍රධාන ලෙජරයේ ආදායම්, වියදම්, අත්තිකාරම්, තැන්පතු, ණය සහ වත්කම් ගිණුම් මාසිකව යාවත්කාලීන කරමින් ගිණුම් තැබීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 අංක 03 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනතේ 3 වගන්තිය | - | යම් කර්මාන්තයක හෝ සේවාවක නියුක්ත සියළුම සේවකයන් සඳහා ජාතික අවම මාසික වේතනය රුපියල් දසදහසක් වියයුතු වුවත්, සභාව මඟින් පාලනය කරනු ලබන හිටුවල පෙරපාසලේ පාලිකාව සඳහා මාසිකව රු. 2,500 ක දීමනාවක් 2012 වර්ෂයේ සිට ගෙවා තිබුණි. |
| (ඈ) | 2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත | - | 2016 පෙබරවාරි ආරම්භ කරන ලද රයි - කැපෝක්වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මුදල් රෙගුලාසි 71 | - | 1986 වර්ෂයේ සිට සභාව මඟින් පාලනය කරනු ලබන පෙරපාසල් 02 ක් සඳහා පෙරපාසල් පාලිකා තනතුරු 02 ක් අනුමත කර ගැනීමට 2018 අප්‍රේල් දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 371(5) | 4,510,231 | අත්තිකාරම් ලේඛනය අනුව 2002 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා නිකුත් කරන තිබුණු එකතුව රු. 4,510,231 ක් වූ අත්තිකාරම් 110 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | 959,348 | 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පොදු තැන්පත් ගිණුමේ පැවති රු. 959,348 ක් වූ හිමිකම් නොපාන ලද ඉකුත් වූ තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 හා 3.2 ඡේද | 9,796,407 | කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමේ දී පිළිපැදිය යුතු අවශ්‍යතා අනුගමනය නොකර ඇස්තමේන්තු වැඩ වටිනාකම රු. 9,796,407 ක් වූ කොන්ත්‍රාත් 15 ක් පිරිනමා තිබුණි. |
| (උ) | 2015 ජුලි 15 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2013 ජුනි 05 දිනැති අංක PCMO/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපිය | - | ගර්හිත තත්ත්වයේ පවතින කැබ් රථයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 1975 පළාත් පාලන විශ්‍රාම වැටුප් නියෝගයේ 36 ඡේදය | 156,440 | 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ලැබූ පළාත් පාලන සේවයේ විශ්‍රාමික නිළධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා සභාව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතුව රු. 156,440 ක් 2018 අප්‍රේල් වනවිටත් ගෙවා නොතිබුණි. |
| (එ) | 2016 ඔක්තෝබර් 19 දිනැති අංක ACLG 01/15 දරන පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය | | 2011 වර්ෂයේ වරිපනම් තක්සේරු පදනම් කර ගනිමින් වරිපනම් බදු අයකර තිබූ අතර තක්සේරු ප්‍රතිශෝධනයක් කිරීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,520,417 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,811,194 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල්කල ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුලු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුලු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,184,659 | 4,081,871 | 6,482,921 | 3,881,128 | 5,231,304 | 5,225,937 | 5,671,305 | 3,745,494 |
| (ii) | කුලී | 308,120 | 312,120 | 312,120 | - | 263,132 | 263,132 | 252,632 | 10,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 450,000 | 450,000 | 483,396 | - | 325,000 | 275,000 | 362,640 | - |
| (iv) | වෙනත් ආදායම් | 1,030,000 | 819,390 | - | 1,309,715 | 9,434,715 | 648,197 | 1,223,438 | 490,325 |
| | එකතුව | 6,972,779 | 5,663,381 | 7,278,437 | 5,190,843 | 15,254,151 | 6,412,266 | 7,510,015 | 4,246,319 |

### 2.2.2 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදුවල බිල් කළ ආදායම රු. 1,144,066 කින් අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ සඳහා හිඟව තිබූ වරිපනම් හා බදු රු. 3,881,128 ක් අයකර ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3 වෙනත් ආදායම්

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායම්වල ඇස්තමේන්තුගත ආදායම රු. 8,404,715 කින් අඩු වී තිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2016 මැයි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු උසාවි දඩ මුදල් රු. 206,195 ක් හා 2015 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාළව ලැබියයුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

3.1 කාර්ය සාධනය
------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
----------------------

ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, කසල කළමනාකරණය, යන්ත්‍ර කුලියට දීම, ජල සම්පාදනය හා ජල ව්‍යාපෘති කළමනාකරණය සහ දියපහස ගිමන්හල ගාස්තු නියාමන කටයුතු වලට අදාලව අතුරු ව්‍යවස්ථා පැනවීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය
---------------------------------

මධ්‍යම පරිසර අධිකාරියේ "පිළිසරු" ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ආධාර මත රු. 8,864,327 ක් වැය කර "රයි කැපොක්වත්ත" නැමති ස්ථානයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකර තිබූ අතර ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා නොහැකි අපද්‍රව්‍ය දළ වශයෙන් මෙ.ටොන් 610 ක් වාර්ෂිකව මෙම මධ්‍යස්ථානයේ බිම් පිරවුමට ගොඩ ගසමින් තිබුණි. එම අපද්‍රව්‍ය තොගය පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු නොකිරීම නිසා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය භූගත ජලයට හා පරිසරයට මිශ්‍ර වීමෙන් පාරිසරික හානි ඇතිවීමේ අවදානමක් පැවතුණි. එමෙන්ම වාර්ෂිකව එකතුවන අපද්‍රව්‍ය වලින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය මෙ.ටොන් 600 ක් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගැනීමට ක්‍රමවේදයක් 2018 අප්‍රේල් වනවිටත් සකස් කර නොතිබීමෙන් ව්‍යාපෘතියේ අරමුණ ඉටුවී නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 මැයි වන විටත් සකස් කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තෘතීය සේවා මට්ටමේ රාජ්‍ය කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ ලේකම් තනතුර පුරප්පාඩු වී තිබුණු අතර රාජ්‍ය කළමනාකරණ I ශ්‍රේණියේ නිලධාරියකු වර්ෂයේ මැයි සිට ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා පළාත් පාලන කොමසාරිස් විසින් පත්කර තිබුණි.

(ආ) ආදායම් පරීක්ෂක, කළමනාකරණ සහකාර, ආයුර්වේද ඖෂධ සංයෝජක, සෞඛ්‍ය කම්කරු, පුස්තකාලාධිපති සහ ක්ෂේත්‍ර කම්කරු යන තනතුරුවල පවතින පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාල කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට බාධා වී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පඹහින්න සතිපොළ 1977 වර්ෂයේ සිට පඹහින්න මංසන්ධියේ සිට පඹහින්න කුඹල්ගම මාර්ගයේ මාර්ග උරහිසෙහි පවත්වන බැවින් වෙළෙඳුන් හා පාරිභෝගික ජනතාව වර්ෂාවෙන් හා වාහන තදබදයෙන් දැඩි අසීරුතාවයට හා අවදානමකට ලක්ව තිබුණි. සති පොළ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂයන්හිදී රු. 4,561,397 ක් වැයකර තිබුණද, පොළ පැවැත්වීමට සුදුසු පරිදි සංවර්ධන කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) මාර්ග නඩත්තු සැලැස්ම අනුව මසකට මාර්ග කිලෝමීටර් 01 ක් නඩත්තු කිරීම සඳහා සැලසුම් සකස් කර තිබීම හේතුවෙන් සාධාරණ කාලපරිච්ඡේදයක් තුල සභාව සතු මාර්ග කිලෝමීටර් 428 ක් ආවරණය වන පරිදි නඩත්තු සැලැස්ම සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී මාර්ග නඩත්තු කිරීම සඳහා වෙන්කර තිබූ රු. 100,000 ක ප්‍රතිපාදන වලින් රු. 76,840 ක් ඉතිරිවී තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වෙන්දේසි කරන ලද ඉඩම් 07 ක් සම්බන්ධයෙන් ඉඩම් විකිණීම්වලට අදාලව කට්ටි සැලැස්ම අනුමත කිරීමට පෙරාතුව විකිණීමට යටත් බිම් කොටස්වල, සත්‍ය විකුණුම් වටිනාකම පිළිබඳව තක්සේරුවක් ලබා ගැනීමට හා විකුණනු ලබන වටිනාකමෙන් සියයට 1 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පින්නවල පොළ භූමියේ කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගේ 2017 පෙබරවාරි තක්සේරුව අනුව මාසික බදුකුලිය රු. 1,000 ක් ලෙස ප්‍රතිශෝධනය කිරීමට කටයුතු නොකර කඩ කාමර 5 කින් රු. 1,500 සිට රු. 2,650 ක් දක්වා වූ බදු මුදල් අයකරගෙන තිබුණි.

(ඉ) සබරගමුව විශ්වවිද්‍යාලයට අයත් පඹහින්න මංසන්ධියට ආසන්න ඉඩමේ 2014 වර්ෂයේ රු. 490,000 ක් වැයකර ඉදිකර තිබුණු පොදු වැසිකිළිය සභාව විසින් ආදායමක් ඉපයීමට හැකි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2015 වර්ෂයේ සිට රු. 10 ක ගාස්තු අය කිරීම මත වෙළඳසැලක් මඟින් මෙම වැසිකිළිය පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය.

3.4 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

වටිනාකම රු. 3,410,000 ක් වු සභාවට අයත් ගලි බවුසරය හා යන්ත්‍ර උපකරණ 03 ක් වර්ෂ 03 සිට වර්ෂ 08 දක්වා කාලපරිච්ඡේදයක සිට නිෂ්කාර්යව පැවතුණි.

3.5 අවිධිමත් ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු බෙලිහුල්ඔය " දිය පහස" ගිමන්හල පරිශ්‍රය තුළ බදුකරු විසින් සභාවේ අවසරයකින් තොරව 2014 වර්ෂයේ සිදුකළ ඉදිකිරීම සම්බන්ධයෙන් සභාපතිගේ උපදෙස් මත 2015 වර්ෂයේ දී තක්සේරුවක් සිදුකර රු. 289,682 ක් බදුකරු වෙත ගෙවා තිබුණි. සභා අරමුදලට නීත්‍යානුකූල නොවූ මෙම ගෙවීමෙන් රු. 72,000 ක් බදුකරු විසින් ආපසු ගෙවා තිබු නමුත් ඉතිරි රු. 217,682 ක් අයකර ගැනීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) බෙලිහුල්ඔය " දිය පහස" ගිමන්හල 2016 වර්ෂයේ දී රු. 155,000 කට බදු දී තිබුණු අතර බදුකරු විසින් එය රු. 250,000 කට අතුරු බදු දී තිබුණි. බදුකරු විසින් 2017 පෙබරවාරි ගිමන්හල ආපසු සභාවට භාර දී තිබුණද, අතුරු බදු දී ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් බදුකරුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හා ගිමන්හලේ කඩ කාමර නැවත බදුදීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වැනි පරිච්ඡේදයේ 4.2.1(අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සභාව විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

කැපොක්වත්ත කසළ කළමනාකරණ පරිශ්‍රයේ ඇති කොන්ක්‍රීට් මාර්ග තලයේ දිග මීටර් 7.7 ක් සහ පළල මීටර් 1.5 ක් වු කොටසක් කැඩී මාර්ගයෙන් පිටතට තල්ලු වී තිබුණද, රු. 83,652 ක්වු රඳවාගැනීමේ මුදල් භාවිතා කර එය පිළිසකර කිරීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය තුල සභාවේ පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. මිලියන 43.91 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 34.95 ක් වීමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 8.6 ක් හෙවත් සියයට 20 ක් උපයෝජනය කර නොතිබුණි. ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන රු. මිලියන 2.02 ක් වූ අතර එහි තත්‍ය වියදම රු. මිලියන 1.34 ක් විමෙන් ප්‍රතිපාදන වලින් රු. මිලියන 0.68 ක් හෙවත් සියයට 34 ක් උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළදී සභාව සතු යන්ත්‍ර කුලියට දීමෙන් රු. 1,000,000 ක ආදායමක් ඇස්තමේන්තු ගත කර තිබුණද, එයින් රු. 803,275 ක් හෙවත් සියයට 80 ක් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ඵලදායී මූල්‍ය පාලන කාරකයක් ලෙස අයවැය ලේඛනය යොදවා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට 2018 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම.<br>(ii) ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් අඩුවෙන් හා වැඩියෙන් ගිණුම්ගත කිරීම |
| (ආ) අයවැය පාලනය | (i) වැය ප්‍රතිපාදනවල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම<br>(ii) ඇස්තමේන්තුගත ආදායම් අය කර නොගැනීම<br>(iii) පරිපූරක ඇස්තමේන්තු පිළියෙල නොකිරීම |

| | |
|---|---|
| (ඇ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අය කර නොගැනීම |
| (ඈ) වාහන පාලනය | වාහන නිෂ්කාර්යව පැවතීම |
| (ඉ) මානව සම්පත් කළමනාකරණය | පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම |
| (ඊ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) ක්‍රමාණුකූලව අපද්‍රව්‍ය බැහැර නොකිරීම<br>(ii) ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයේ අරමුණු ඉටුනොවීම |
| (උ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) සැලසුම අනුව වැඩ අවසන් නොකිරීම<br>(ii) ඉදිකිරීම් නිසි පරිදි නඩත්තු නොකිරීම |